# මගේ පුංචි සුරංගනාවී



**චනුති ඉමායා**

# මගේ පුංචි සුරංගනාවි

චනුති ඉමායා

# '' මගේ පුංචි සුරංගනාවි ''

කතෘ ප්‍රකාශනයකි

$ISBN\ 978-624-206-799-5$

2023.11.15

## කතාව සහ චිත්‍ර

චනුති ඉමායා

2 ශ්‍රේණිය $A$

මහාමායා බාලිකා විදුහල

මහනුවර

# පිදුම

මගේ පංතිභාර

මංජුලා ගුරුතුමියට

මගේ ආදරණීය

අම්මාට අප්පච්චීට

සහ

මගේ පුංචි සුරංගනාවිට

මෙම පොත

ආදරයෙන්

පුදමි.......

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගොලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණන් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතවූ න වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක 'ලියන්නට සිහින දකනි දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තයික් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමකු විදූහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යොජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක්වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදූහල් පතනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.10.20

ඉස්කොලේ ගිහින් ගෙදර ආවාම සෙල්ලම් කරන්න කවුරුත් නෑ සෙල්ලම් බඩු ගොඩාක් තිබුණත් මට සෙල්ලම් කරන්න හිතෙන්නේ නෑ. '' අම්මා මට සෙල්ලම් කරන්න කවුරු හරි ඕනේ. මට හරි පාළුයි. මට බෑ මේ ගෙදර ඉන්න. මට නංගි කෙනෙක් ඕනේ අම්මේ'' මම අම්මාට කරදර කර කර කිව්වා.





ටික දවසක් ගියා අම්මයි අප්පච්චියි මාව ඩොක්ටර් අංකල් ළඟට ගෙනිච්චා. '' මෙන්න ඔයාගේ නංගි බබා''. ඩොක්ටර් අංකල් මට ටීවී එකකින් නංගිව පෙන්නුවා. '' අනේ මගේ නංගි'' මට ඇඬුණා , මම සතුටින් උඩ පැන්නා. මම ඒ ටීවී එකට උම්මා දුන්නා. හැමෝම හිනා වුණා.

අම්මාගේ බංඩියේ දැං නංගි බබෙක් ඉන්නවා. දැං අම්මාගේ බංඩිය ටිකක් ලොකුයි. ඒත් අම්මා හරියට කෑම කන්නේ නෑ. හැමතිස්සේම නිදා ගන්නවා. මට අම්මා ගැන දුකයි. මම අම්මාගේ බංඩියට කතා කළා. ''අනේ නංගි බබෝ අම්මට කරදර කරන්න එපා. ඔයා මගේ පුංචි සුරංගනාවිනේ.''



නංගී එන දවස ටික ටික ලංවුණා. අප්පච්චියි මමයි එකතු වෙලා අපේ කාමරය ලස්සන කරා. ලස්සන සත්තු, මල්, ගස්, තියෙන පිංතූර බිත්තියේ ඇලෙව්වා. කාමරය දැං හරිම ලස්සනයි. නංගි ආවාම මම එයාට සත්තු, මල්, ගස් ගැන කියලා දෙනවා.





නංගි එන දවස හොඳටම ලංවුණා. අප්පච්චි අම්මාව එක්කරගෙන ඉස්පිරිතාලෙට යන්න ලෑස්ති වුණා. අත්තම්මා අම්මාව බදාගෙන ඇඬුවා''අනේ බුදු සාදු අම්මවයි නංගිවයි බලා ගන්න'' මම බුදු සාදුගෙන් වැඳලා ඉල්ලුවා.



''දෝණි මෙන්න ඔයාගේ නංගි බබා'' අත්තම්මා ෆෝන් එකෙන් නංගි බබාගේ ෆොටෝ එකක් මට පෙන්නුවා. අපි ඉක්මනින් නංගිව බලන්න යන්න ලෑස්ති වුණා. මම තියෙන ලස්සනම ගවුම ඇන්දා. ලස්සන කොණ්ඩ කටු ගැහුවා. සුවඳ වෙන්න ඕඩි කොලෝන් දැම්මා. මට හරිම සතුටුයි.

අපි අම්මා ඉන්න කාමරයට ගියා. '' මගේ මැණික මෙන්න ඔයාගේ නංගි බබා'' අම්මා මට නංගිව පෙන්නුවා. අනේ එයා රෝස මලක් වගේ. රෝස පාටයි. එයා හොඳටම නිදි . මට එයාව පෙනුණේ පුංචි සුරංගනාවියක් වගේ. මම නංගිව ලංකර ගත්තා. එයාව ආදරෙන් ඉම්බා. මට ඇඬුණා. හැමෝම අඬනවා අපිට හරිම සතුටුයි.





දවස් දෙකකින් නංගිව ගෙදර ගෙනාවා. අපි එයාට නමක් දැම්මා. මගේ නම චනුති ඉමායා. නංගිගේ නම චනුලි ටිනායා. අපි දෙන්නගෙම නම් එක වගේ. පුංචි සුරංගනාවි නිසා දැං අපේ ගෙදර පාළු නෑ. මගේ නංගි ළඟ හරිම සුවඳයි.

මම නංගිගේ රෙදි සෝදන්න වේලන්න උදව් වෙනවා. මම නංගිට පේන්න නටනවා. සිංදු කියනවා. කතන්දර කියනවා. එතකොට නංගි මට '' අක්කා'' කියලා කතා කරනවා. මම දැං සතුටින්.



මගේ නංගි ඉක්මනින් ලොකු වෙනකල් මම බලාගෙන ඉන්නේ. මම එයා එක්ක සෙල්ලම් කරනවා. එයාට අකුරු කියලා දෙනවා. මම මගේ පුංචි සුරංගනාවිත් එක්ක නටනවා. නංගි මගේ පණ වගේ. මම එයාව ආදරෙන් බලාගන්නවා.



මම හවසට බුදු සාදුට වඳිනකොට  අපිව හැමදාමත් සතුටින් තියන්න කියලා ඉල්ලනවා. මගේ නංගි තමයි මට ලැබුණු පුංචි සුරංගනාවි. මම නංගිට හුඟක් ආදරෙයි. පුංචි සුරංගනාවි මගේ පණ වගේ.



## පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දූරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20